# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2063/6 - 2018 මාර්තු මස 19 වැනි සඳුදා - 2018.03.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධිත) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය, පහත දැක්වෙන ඉඩම් ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ/පරවශතාවේ විස්තර:*

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, නිවිතිගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, නවදුන් කෝරළේ මැද පත්තුව සුළු කොට්ඨාසයේ, යක්දෙහිවත්ත ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, නිවිතිගල ගමේ පිහිටි සර්වේ ජනරාල් විසින් සම්පාදිත 2017.05.09 දිනැති කැඩැස්තර සිතියම් අංක 620400 හා කලාප අංක කලාප 07 න් 02 වැනි කලාපය පත්‍ර අංක 03 දරන පිඹුරේ කැබලි අංක 148 වශයෙන් පෙන්නුම් කර ඇති මුළු ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0526 ක් පමණ වූ පහත විස්තර කර ඇති ඉඩම් කැබලි

1. කැබලි අංක 148
ඉඩමේ නම: -; මුල් හිමිකම් පාන්නා: ජී. ඩබ්. නිමල් ජයතිස්ස; ප්‍රමාණය: හෙක්: 0.0526.

ඉහත සඳහන් ඉඩම්වලට හිමිකම් අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන්ගේ හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2018 මැයි මස 07 වැනි දින පෙ.ව. 10.00 ට නිවිතිගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2018 අප්‍රේල් මස 27 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩමට ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

එම්. එස්. අවන්ති සේනාරත්න,
ප්‍රාදේශීය ලේකම්
නිවිතිගල.

2018 මාර්තු මස 15 වැනි දින දී,
නිවිතිගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

04 - 02

1A - G 27321 - 17 (2018/03)
මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.